**මිනිපේ ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------**

මිනිපේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මිනිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බාහිර ආයතනවල ප්‍රතිපාදන උපයෝජනය කර ඉටුකළ ව්‍යාපෘති 03 කට අදාළ රු.297,000 ක රඳවුම් මුදල කර්මාන්ත ණයගැතියන් සහ ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2022 අවසන් ගිණුම පිළියෙල කිරිමේදි ජ'නල් සටහන් මගින් නිවැරදි කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | භාණ්ඩ විෂයයන් 14 කට අදාළ රු.193,795 ක ලිපිද්‍රව්‍ය තොග මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | තොග ලේඛන නිවැරදිව පිළියෙල කිරීමට නිලධාරියා දැනුවත් කර ඇත. | තොග ලේඛන යාවත්කාලීන කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු වර්ග 2කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.6,055,662 ක් වුවද තැන්පතු ලේඛනය අනුව එම ශේෂය රු.6,043,634 ක් වූයෙන් රු.125,528 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම්වලට හේතු සොයා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් නිවැරදි කළ යුතුය. |

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු ගබඩා, ලී බඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලේඛන විධිමත්ව පවත්වා නොතිබීම හේතුවෙන් රු.14,023,545 ක වත්කම් ශේෂ සනාථ කර ගැනීමට නොහැකි විය. | 2022 දෙසැම්බර් 31 දිනට ගිණුමට ගැලපිය හැකි පරිදි සකස් කරන බව දන්වා ඇත. | උපයෝගී ලේඛන යාවත්කාලීන කර මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට විධානයට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | සභා බල ප්‍රදේශයේ පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 2 කින් අයවිය යුතු බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදි එම බලපත්‍ර ගාස්තු අය කර ගන්නා බව දන්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව ගාස්තු අය කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,014,634 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,225,811 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හසලක පොදු වෙළඳපළ පාර හා පොදු වෙළඳපල - පල්ලේවත්ත හිඟ කඩ කාමර වලට අදාළව අයවිය යුතු කඩ කුලී රු.2,023,279 ක් වූ අතර ඉන් රු.1,704,779 ක් වසරකට අධික කාලයක සිට අය නොවී පැවති ශේෂ විය. හිඟ අය කිරීම සඳහා නඩු පැවරීමට කටයුතු කළ ද, ගිවිසුම්වල කාලය සඳහන් නොවීම හා ගිවිසුම්වල අඩුපාඩු පැවතීම හේතුවෙන් නඩු නිෂ්ප්‍රභා වී තිබූ අතර මෙම කඩ කාමර පිහිටි ඉඩම්වල අයිතිය සභාව වෙත නොමැති වීම හේතුවෙන් සන්තකය පවරා ගැනීම සඳහා නඩු පැවරීමට ද නොහැකි වී තිබුණි. එමෙන්ම හසලක නගරයේ කඩ කාමර 20 කට අදාළව අය විය යුතු රු.8,711,434 ක හිඟ කඩ කුලී ගිවිසුම් අනුව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනය හා එකඟ වන බව දන්වා ඇත. | ගිවිසුම් අනුව හිඟ ශේෂ අයකර ගත යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1997 වර්ෂයේ දී පෞද්ගලික පාර්ශවයකට අයත් ගොඩනැගිල්ලක අත්තිවාරම එවකට සිටි සභාපතිවරයා විසින් කඩා ඉවත් කිරීම නිසා අධිකරණය විසින් සිදු වූ අලාභය වෙනුවෙන් රු.24,709 ක් ගෙවීමට නියම කර තිබුණද එම මුදල නොගෙවීම හේතුවෙන් නැවත අධිකරණ නියෝගය මත සභාවට රු.530,500 ක් අදාළ පාර්ශවයට ගෙවීමට සිදුවී තිබුණි. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා සභා අරමුදලට සිදුවූ පාඩුව අදාළ පාර්ශවයන්ගේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සිදු වී ඇති අලාභය හා එහි වගකිව යුත්තන් සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර, අදාළ පරීක්ෂණය සිදුකර වාර්තාව ලබා දීමෙන් පසු ඔබ වෙත වාර්තා කරන බව දන්වා ඇත. | සභා අරමුදලට සිදු වූ පාඩුව අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ජල පාරිභෝගිකයින් සංඛ්‍යාව 1651 ක් වුවද ජල පාරිභෝගිකයින් 438 ක ගෙන් පමණක් ජල මනු අනුව නියමිත ගාස්තුව අය කිරීමට කටයුතු කර තිබුණි. එමෙන්ම අක්‍රීය ජල මනු සංඛ්‍යාව 795 ක් හා ජල මනු සවි නොකල ජල පාරිභෝගිකයින් සංඛ්‍යාව 411 ක් විය. | ගුරුළුපොත ජල පෙරනය සකස් කර නිමවූ වහාම සියළු ජල පාරිභෝගිකයින්ට ජල සම්බන්ධතා ලබා දී විධිමත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ජල මනු සවිකර ක්‍රමවත්ව ජලය සැපයීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ජල ගාස්තු ශේෂය රු.4,529,064 ක් වූ අතර ඉන් රු.618,896 ක් ජල සම්බන්ධතා විසන්ධි කර තිබුණු පාරිභෝගිකයින්ගෙන් අය විය යුතුව පැවතුණි. එමෙන්ම මෙම හිඟ ගාස්තු අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව අදාළ කටයුතු කර නොතිබුණි. | හිඟ ජල සම්බන්ධතා විසන්ධි කිරීම, නීති මාර්ගයෙන් කටයුතු කිරීම, ගෙයින් ගෙට නිලධාරීන් යවා අයකර ගැනීම හා ජංගම සේවා පවත්වා අයකර ගැනීම වැනි වැඩ පිළිවෙලක් යොදා ඇති බව දන්වා ඇත. | ගිවිසුම් අනුව හිඟ ජල ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් රු.2,070,950 ක වාහන 04 ක් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් වසර 08 ක කාලයක් සභා භූමියේ ගාල්කර තිබුණි. | ට්‍රැක්ටරය හා වේලරය යන වාහන දෙක වෙන්දේසි කිරිම සඳහා මිල තක්සේරුවක් මධ්‍යම පළාත් ඉංජිනේරු තුමිගෙන් ලබාගෙන ඇති අතර සිංගල් කැබ් රථය අලුත්වැඩියා කර භාවිතයට ගැනීම සඳහා මධ්‍යම පළාත් ඉංජිනේරුතුමිය වෙත ඉදිරිපත් කර අවසර ලබාගෙන ඇති බව දන්වා ඇත. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |